**නියාගම ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 13 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බැලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා ගෙවූ පොලී රු.331,378 ක් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකර ණය ශේෂයෙන් අඩු කිරීම නිසා ගෙවිය යුතු ණය ප්‍රාග්ධනය එම වටිනාකමින් අඩුවෙන් දැක්විණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | පෙර වර්ෂයන්ට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලද මුද්දර ගාස්තු රු.4,707,842 ක් හා උසාවි දඩ රු.172,600 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබීම් ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ නිම කරන ලද කර්මාන්ත සඳහා ගෙවිය යුතු එකතුව රු.2,029,180 ක වියදම සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත සඳහා ලැබිය යුතු එකතුව රු.2,239,976 ක් ගිණුම්ගත නොකිරීම නිසා | නිවැරදිව ගිණුම්ගත | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී |

| | | |
|---|---|---|
| වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) **නොසැසඳුනු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.1,863,985 ක තැන්පත් ශේෂයන් හා ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.662,152 ක අසමානතා පැවතිණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමාන - තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) **ලැබිය යුතු ගිණුම්**<br>සමාලෝචිත වර්ෂය අවසානයට රු.18,177,087 ක හිඟ හිටි වෙනත් ආදායම් ශේෂයක් පැවතුණ ද, ලේඛන නඩත්තු නොකිරීම නිසා හිඟ ශේෂයන්ගේ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරුණි. | හිඟ ආදායම් අයකර ලැබිය යුතු ගිණුම් ශේෂ අවම කරගත යුතු වේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) **ගෙවිය යුතු ගිණුම්**<br>ඉකුත් වර්ෂ 03 ක ඉටු කරන ලද කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු රු.10,411,232 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ පියවීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.116,279,460 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 131 වගන්තිය | - | බැංකු ජංගම ගිණුම් දෙකක රු.18,963,101 ක සාමාන්‍ය මාසික ශේෂයක් පැවතිය ද, අතිරික්ත මුදල් ආයෝජනය කිරීමෙන් ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතිරේක මුදල් ආයෝජනය කර සහා අරමුදල වර්ධනය කරගත යුතු වේ. | ඉදිරියේ දී අතිරික්ත මුදල් ආයෝජනය කිරීම පිළිබඳ සලකා බලමි. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | | |
| | (i) මුදල් රෙගුලාසි 387 | 1,334,630 | බැංකු ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් ලිවීම නිසා සමාලෝචිත වර්ෂයේ මාස 04 ක මුදල් පොත අනුව බැංකු ගිණුමේ | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මුදල් පොතේ බැර ශේෂයක් ඇති නොවන පරිදි ගෙවීම් කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ශේෂය අහිතකර ශේෂයක් වී තිබුණි. | | |
| (ii) | මුදල් රෙගුලාසි 571 | 2,573,820 | කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,435,278 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,366,313 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාරක ප්‍රාග්ධනය සෘණ අගයන් ගැනීම හා සමුච්චිත අරමුදල් ගිණුමේ හර ශේෂයක් පැවතීම සභාවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අයහපත්ව බලපානු ලැබේ. | කාරක ප්‍රාග්ධනය වර්ධනය කර, සමුච්චිත අරමුදල යහපත් කරගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,419,850 | 1,461,880 | 1,746,829 | 375,934 | 1,197,304 | 699,772 | 623,793 | 503,984 |
| කුලී | 5,690,850 | 4,620,375 | 4,969,716 | 150,664 | 6,452,280 | 589,052 | 3,621,611 | 301,664 |
| බලපත්‍ර ගාස්තු | 310,625 | 419,286 | 421,411 | - | 345,500 | 859,828 | 886,728 | 14,867 |
| වෙනත් ආදායම් | 35,695,672 | 34,472,853 | 35,053,168 | 12,875,615 | 39,260,692 | 29,946,212 | 27,266,241 | 8,348,986 |
| | 43,116,997 | 40,974,394 | 42,191,124 | 13,402,213 | 47,225,776 | 32,094,864 | 32,398,373 | 9,169,501 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.9,169,501 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.40,974,394 ක් විය. ඒ අනුව අයවිය යුතු මුළු ආදායම රු.50,143,895 ක් විය. වර්ෂයේ අයවීම් රු.42,191,124 ක් වීමෙන් ආදායම් අයවීම සියයට 84 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් හා බිල් කිරීම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.3.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.4 කුලී ආදායම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.151,000 ක ආදායම් කපාහැරීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය. ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු අතර ආදායම් කපා හැරීමට ප්‍රමාණවත් හා විධිමත් අනුමැතියක් ලබාගත යුතු වේ. | ආදායම් කපා හැරීමට අදාළ සභා තීරණය ඉදිරිපත් කරමි. ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.5 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වෙනත් ආදායම් රු.12,875,615 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.4,526,629 ක් හෙවත් සියයට 54 ක වැඩිවීමක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.2,979,133 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.9,426,055 ක් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | අයවිය යුතු මුදල් ලබාදෙන ලෙස ප්‍රධාන ලේකම්වරයාට ලිපි යවා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා

සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි |

**(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ ව්‍යාපෘති 03 ක් සඳහා රු.260,000 ක් ද, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති 05 ක් සඳහා රු.375,000 ක් ද ලැබී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ කර්තව්‍යයන් ඉටුකර නොතිබුණි. | සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් ඉටු කළ යුතු වේ. | 2019 වර්ෂයේ එම ව්‍යාපෘතිය ඉටුකර ගැනීමට කටයුතු කරමි. |

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් තොරව කාබනික පොහොර අංගනයක් ඉදිකිරීම වෙනුවෙන් 2009 වර්ෂයේ පිළිසරු ව්‍යාපෘතියෙන් රු.1,201,655 ක් ලබාගෙන, වැයකර තිබූ අතර, 2016 වර්ෂයේ දී ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අතහැර දමා තිබුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් අවශ්‍ය වේ. | රජයේ ඉඩමක් ලබා ගැනීම සඳහා කටයුතු කරන අතර, දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කරමි. |

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්සකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ පිහිටි වරිපනම් බදු අයකළ හැකි ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට සමාලෝචිත වර්ෂය තුළ ද කටයුතු කර නොතිබුණි. | වරිපනම් ප්‍රදේශ නම් කර වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරුවක් මත ඉදිරියේ දී වරිපනම් ප්‍රාදේශ නම්කර, වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) **සේවක පුරප්පාඩු** | | |
| අනුමත සේවක සංඛ්‍යා සැලැස්ම අනුව 11ක් වූ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සඳහා විධිමත්ව බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර, පුරප්පාඩු බඳවා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | ආදේශක තනතුරක් ලෙස මුරකරුවකු සැප්තැම්බර් මස සිට බඳවාගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයට වැටුප් ලෙස රු.71,133 ක ගෙවා තිබුණි. | ආදේශක තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කර ගනිමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

---------------------------

**නිෂ්ක්‍රීය වත්කම්**

------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| භාවිතයෙන් ඉවත් කරන ලද කැබ් රථයක් හා හෑඩිමෙක් යන්ත්‍රය වසර 03 කට අධික කාලයක් නිෂ්කාර්යයව සහා භූමියේ ගාල්කර තිබූ අතර, මේ සම්බන්ධයෙන් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අපහරණය කිරීමට කටයුතු කරමි. |

**3.5 හඳුනාගත් පාඩු**

----------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2002 වර්ෂයේ අස්ථානගත වූ රු.72,980 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් තවදුරටත් අයවිය යුතු රු.52,980 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම 2017 වර්ෂයේ රු.19,624 ක පුස්තකාල පොත් අස්ථානගත වීම් සම්බන්ධයෙන් ද කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයක රු.312,957 ක් වූ ඇස්තමේන්තුගත මුළු මුදලම ඉතිරි වී තිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වියදම් විෂයයන් 05 ක ඉතිරිවීම් වල එකතුව රු.16,392,007 ක් වූ අතර, එම වටිනාකම් සියයට 41 සිට සියයට 77 අතර පරාසයක පැවතුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ආදායම් විෂයයන් 02 ක ළඟාකර නොගත් ඉලක්කයන්ගේ එකතුව රු.13,757,075 ක් වූ අතර, එම වටිනාකම් සියයට 63 සිට සියයට 77 අතර පරාසයක පැවතුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක ආදායම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ . | ඉදිරියේ දී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |